# ශාස්ත්‍රවේදී විශේෂ උපාධි (භූගෝලවිද්‍යාව) - තෙවන භාගය

## ප්‍රථම සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2019

## GYG 4199 - ව්‍යවහාරික වෛද්‍ය භූගෝලවිද්‍යාව

**පැ දෙකයි (02)**

ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න.

---

1. i වායු-ව්‍යාප්ත රෝග <u>හතරක්</u> නම් කරන්න. (ලකුණු 02)

   ii වායු-ව්‍යාප්ත රෝග සඳහා හේතු වන ප්‍රධාන රෝගකාරක කාණ්ඩ <u>තුන</u> කවරේද? (ලකුණු 04)

   iii අංක 1(ii) යටතේ ඔබ සඳහන් කරන ලද ප්‍රධාන රෝගකාරක කාණ්ඩ තුන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

   iv "වායු-ව්‍යාප්ත රෝග අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමේදී විවිධ මට්ටමේ ධුරාවලි සැලකිල්ලට ගැනීම අවශ්‍ය වේ." මෙම අදහස විවේචනාත්මකව විමසන්න. (ලකුණු 08)

2. i "රෝග විසරණය (Diffusion of diseases)" යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02)

   ii රෝග විසරණ රටා කෙරෙහි ඉවහල්වන භූගෝලවිද්‍යාත්මක සාධක කවරේද? (ලකුණු 04)

   iii දේශගුණ වෙනස්වීම් රෝග විසරණය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

   iv වාහකයින්ගෙන් ව්‍යාප්ත වන රෝග වළක්වා ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii සෞඛ්‍ය ආරක්ෂණ අසමානතා කෙරෙහි ඉවහල්වන සාධක දක්වන්න. (ලකුණු 04)

iii සමාජ-ආර්ථික අසමානතා මිනිසාගේ මානසික සෞඛ්‍යය කෙරෙහි බලපාන්නේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

vi "භූගෝලීය ප්‍රදේශයක් තුළ සමානත්වයෙන් යුත් සෞඛ්‍ය ආරක්ෂණයක් ඇති කිරීම සඳහා අංග සම්පූර්ණ පහසුකම්, විවිධ ආයතනවල සහභාගිත්වය සහ පුහුණුව ලැබුවන් අත්‍යවශ්‍ය සංරචක වේ". මෙම අදහස සුදුසු උදාහරණ සහිතව තර්කානුකූලව විමසන්න. (ලකුණු 08)

4. i "පරිසර පද්ධතියක් (Eco-system)" යනුවෙන් ඔබ අදහස් කරනුයේ කුමක්ද? (ලකුණු 02)

ii පරිසර පද්ධතියක මානව යහ පැවැත්ම සඳහා දායක වන ප්‍රධාන සේවාවන් කවරේද? (ලකුණු 04)

iii මිරිදිය ජලයෙහි වර්තමාන තත්ත්වය මානව සෞඛ්‍යය කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv පරිසර පද්ධති සේවාවන්ගේ අනාගත වෙනස්වීම් මානව යහ පැවැත්ම කෙරෙහි බලපෑ හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

5. i ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ලැබෙන නිදන්ගත රෝග <u>හතරක්</u> නම් කරන්න. (ලකුණු 02)

ii උග්‍ර රෝග **(Acute diseases)** සහ නිදන්ගත රෝග **(Chronic diseases)** අතර වෙනස දක්වන්න (ලකුණු 04)

iii දිළිඳුබව සහ නිදන්ගත රෝග අතර සම්බන්ධතාව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv දකුණු ආසියාතික කලාපයෙන් උදහරණ ගෙනහැර දක්වමින් නිදන්ගත රෝගවල වර්තමාන උපනති සාකච්ඡා කරන්න. (ලකුණු 08)

6. i "සෞඛ්‍ය සැළසුම්" යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02)

ii තිරසාර සෞඛ්‍ය සැළසුමක මූලධර්ම කවරේද? (ලකුණු 04)

iii ශ්‍රී ලංකාවේ තිරසාර සෞඛ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මතු වී ඇති සංරෝධක කෙටියෙන් විමසන්න. (ලකුණු 06)

iv සෞඛ්‍යය ක්ෂේත්‍රයේ පවතින ප්‍රතිපත්ති සහ ක්‍රමෝපායන් පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ සෞඛ්‍යය සවිබලගැන්වීමේ වැඩසටහන් සම්බන්ධව ඔබගේ අදහස් සාකච්ඡා කරන්න. (ලකුණු 08)